## වයඹ පළාතේ පළාත් සභාවේ 1999 අංක 02 දරණ
## වයඹ පළාතේ පාරිසරික (සංශෝධන) ප්‍රඥප්තිය

---

වයඹ ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනය : 99.11.10

වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 12 දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

1. මෙම ප්‍රඥප්තිය 1999 අංක 02 දරණ වයඹ පළාතේ පාරිසරික (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

1990 අංක 12 දරණ ප්‍රඥප්තියේ 01 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 12 දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 01 වැනි වගන්තිය වෙනුවට මතු දැක්වෙන වගන්තිය ආදේශ කෙරේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

01. 1990 අංක 12 දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යනුවෙන් මෙම ප්‍රඥප්තිය හඳුන්වනු ලැබේ. මෙහි මින්මතු "විෂය භාර අමාත්‍යවරයා" ලෙස ද හඳුන්වනු ලබන තත්කාලයෙහි පාරිසරික විෂය පවරනු ලැබූ අමාත්‍යවරයා විසින් පනවනු ලබන ගැසට් නිවේදනයක් මගින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතුය.

62 වැනි වගන්තියේ විෂය භාර අමාත්‍යවරයා යන්න සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 62 වැනි වගන්තියේ "විෂය භාර අමාත්‍යවරයා" යන්න මතු දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කෙරේ.

විෂය භාර අමාත්‍යවරයා – යන්නෙන් තත්කාලයෙහි පාරිසරික විෂය භාර පළාත් අමාත්‍යවරයා අදහස් වේ.

◆◆◆◆◆◆◆◆◆◆◆◆◆◆◆◆◆◆◆◆